# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2456/82 – 2025 ඔක්තෝබර් මස 04 වැනි සෙනසුරාදා – 2025.10.04**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2023/182

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

ඒ.ඩී.ගිහාන් තිළිණ මධුශංක මයා, “ තිළිණ ” ලබුවැලහේන,වැතැන්න,කරමැටිය,කිරම.

සහ

ක්‍රිස්ටල් විලාස් (ප්‍රයිවට්) ලිමිටඩ්,මමා රෝමා රෙස්ටුරන්ට්,හොටෙල්- වැලිගම,ගාල්ල මාතර පාර,පැලැන දකුණ,වැලිගම.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ගාල්ල, කිතුලම්පිටිය, වේවැල්වල පාර, අංක.10/51, වසන්ත වික්‍රමරත්න පුංචිහේවා මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 සැප්තැම්බර් මස 26 වැනි දින,
කොළඹ දී ය.

1A – G 045512– 13 (2025/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/02/2023/182

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ඒ.ඩී.ගිහාන් තිළිණ මධුශංක මයා,“ තිළිණ” ලබුවැලහේන, වැතැන්න,කරමැටිය,කිරම.

සහ

ක්‍රිස්ටල් විලාස් (ප්‍රයිවට්) ලිමිටඩ්,මමා රෝමා රෙස්ටුරන්ට්,හොටෙල් - වැලිගම,ගාල්ල මාතර පාර,පැලැන දකුණ,වැලිගම.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

“ක්‍රිස්ටල් විලාස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ සහකාර කෝකිවරයෙකු (Assistant Chef) ලෙස සේවය කළ ඒ.ඩී.ගිහාන් තිළිණ මධුශංක මහතාට 2023 ජනවාරි මස සේවා ගාස්තුව ලෙස රු. 83183/= හිමි බවට සේවායෝජක පිළිගෙන ඇති නමුදු 2023 ජනවාරි මස ඔහු සේවයෙන් ඉවත්වීම හේතුවෙන් සේවායෝජක විසින් එම සේවා ගාස්තුව ඔහුට ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුවී තිබේ ද, යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.”

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 සැප්තැම්බර් මස 17 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 10 – 0058

---

මගේ අංකය: IR/COM/01/2022/121

ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එච්.ඩබ්.එම්.බී.එස්.පී. රාහුබද්ධ මිය, 360/12, මායා මාවත,මාකුඹුර,පන්නිපිටිය.

සහ

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය,අංක 34,ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මාතලේ, මැක්ඩොවල් බලකොටුව මාවත, පළමු පටුමග, 34/64, ඒ.බී.හේරත් මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 සැප්තැම්බර් මස 26 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/2022/121

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එච්.ඩබ්.එම්.බී.එස්.පී. රාහුබද්ධ මිය, 360/12, මායා මාවත,මාකුඹුර,පන්නිපිටිය.

සහ

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය,අංක 34,ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

" ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වාස්තු විද්‍යාඥ ලෙස සේවය කළ එච්.ඩබ්.එම්.බී.එස්.පී. රාහුබද්ධ මිය වෙත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 23/2013 හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 04/2018(1) ප්‍රකාරව ක්ෂේත්‍ර දීමනා සහ වෘත්තීය දීමනා අදාළ චක්‍රලේඛ ක්‍රියාත්මත වූ දින සිට ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා දී තිබියදීත් නොගෙවීම නිසා අසාධාරණයක් සිදුව තිබේද ? එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඇයට හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ."

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 සැප්තැම්බර් මස 17 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 10 – 0059

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.